සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

28 S I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ....

ගෘහ ආර්ථික විද්‍යාව - I

කාලය පැය 02 යි

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (01), (02), (03), (04), (05) අදාළ පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන පිළිතුර තෝරන්න.

(01) ආදි මානවයා සිය වාසස්ථාන ලෙස තෝරාගත් සංවෘත අවකාශය සුව පහසුව සඳහා සකස් කරගත් බවට උදාහරණයකි.
(1) වීදුරු ගෙවල් සෑදීම.
(2) ගල්ගුහාවල ජීවත්වීම.
(3) තට්ටු නිවාස සෑදීම.
(4) ගල් ගුහාවල පොළොව සමතලා කිරීම.
(5) වරිච්චි බිත්ති, ගොමමැටි ගාන ලද පොළොව සහිත නිවාස සෑදීම.

(02) නිර්මාණකරණයේ මූලධර්ම පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) එකම ලක්ෂ්‍යය නැවත නැවත යෙදීම ඍජුව නොපෙනී, වක්‍රාකාරව පෙන්නුම් කිරීම අනාසාත්මක රිද්මයයි.
(2) ගොඩනැගිල්ලේ හෝ එහි ඇතුළත උපාංග, දෘෂ්‍යබර සමමිතික ආකාරයෙන් සකස් කිරීම සමමිතික තුලනයයි.
(3) නිර්මාණයක් සැකසීමේ දී දිග, පළල, උස යන සාධක එකිනෙක නොගැලපෙන අනුපාතයන්ගෙන් සකස්වීම සමානුපාතයයි.
(4) යම් නිර්මාණයක වඩාත් ඉස්මතුවන ලෙස උපාංග නිර්මාණය වීම අවධාරණයයි.
(5) පුනරුක්තිය ඇති තැන රිද්මය ඇත.

(03) නිවසක ක්‍රියානුරූපී බව, ස්වභාවිකත්වය ඇතිකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයකි,
(1) තරප්පු පෙළට කැටයම් සහිත ලී වැටක් සවිකිරීම.
(2) ගෙබිදුලට අලංකාර බිම් ගඩොල් ඇල්ලීම.
(3) කපා දැමූ ගසක කඳ කොටස ආසනයක් ලෙස සකස් කිරීම.
(4) නිදන කාමරයේ වීදුරු ජනේල සවිකිරීම.
(5) විසිත්ත කාමරයේ ගෘහස්ථ පොකුණක් නිර්මාණය කිරීම.

(04) බාහිර අවකාශ නිර්මාණයේ දී සලකා බැලිය යුතු කරුණක් නොවන්නේ,
(1) භූමියේ ඉඩකඩ ප්‍රමාණය පිළිබඳ මූලික දැනුවත් වීම.
(2) ඉඩමේ ධාරිතාව අනුව පොළොව මත හා අවකාශයට දරාගත හැකි ශාක ඝණත්වය පිහිටුවීම.
(3) භූමියේ ස්වභාවයට හා ඉඩකඩ ප්‍රමාණයට ගැළපෙන පරිදි උපාංග තේරීම.
(4) පරිසරයේ පවත්නා ස්වභාවික බවට අනුගතව පවතින ස්වභාවික පරිසරය වෙනස් කිරීම.
(5) ස්වභාවික පරිසරය වෙනස් කරමින් ශාක විවිධ හැඩවලට කැපීම.

(05) සංයුතියෙහි හයිඩ්‍රජන් හා ඔක්සිජන් අතර අනුපාතය 2 : 1 ලෙස දැක්වෙනුයේ,
(1) මේදවල
(2) ප්‍රෝටීන්වල
(3) ප්‍රෝටීන් හා මේදවල
(4) කාබෝහයිඩ්‍රේට් සහ ප්‍රෝටීන්වල
(5) කාබෝහයිඩ්‍රේට්වල

(06) මේද අඩංගු ආහාර වර්ගයක් සම්බන්ධ කරුණු කීපයක් පහත දැක්වේ.

- ඉහළ කැලරි අගයක් ඇත.
- ද්‍රව තත්ත්වයේ පවතී.
- අසන්තෘප්ත මේද අම්ල බහුලව ඇත.

මෙම ආහාරය විය හැක්කේ,

(1) මාළුතෙල් (2) රටකජු තෙල් (3) ඔලිව් තෙල්
(4) සූරියකාන්ත තෙල් (5) සෝයා තෙල්

(07) Ca, Fe, Mg හා විටමින් B අවශෝෂණය අඩුකිරීමට බලපාන ආහාර වර්ගයක් අයත් කාණ්ඩයක් වන්නේ,

(1) කෝපි, තේ (2) මත්පැන්, ඖෂධ (3) බාර්ලි, කෝපි
(4) බිත්තර, මත්පැන් (5) ඖෂධ, කැෆේන් අඩංගු ආහාර

(08) මැරස්මස් හා ක්වොෂියොකෝර් යන රෝග

(1) මන්දපෝෂණයේ ආකාර 2 කි.
(2) උග්‍ර තීව්‍ර මන්ද පෝෂණයේ ආකාරයන් ය.
(3) කාලීන මන්දපෝෂණ ආකාරයන් ය.
(4) යකඩ ඌණතා තත්ව දෙකකි.
(5) දුශ්පෝෂණ තත්ත්වයන් ය.

(09)
- ශරීරයේ විද්‍යුත් විච්ඡේදන සමතුලිතතාව පවත්වා ගැනීමට උදව් වේ.
- O_2 CO_2 හා අපද්‍රව්‍ය පරිවහනයට අවශ්‍ය වේ.
- ශරීරය පුරා පෝෂක පරිවහනයට අවශ්‍ය වේ.

ඉහත ලක්ෂණ පෙන්නුම් කරනුයේ,

(1) තන්තුවල (2) කාබෝහයිඩ්‍රේටවල (3) ලිපිඩවල
(4) ජලයේ (5) පිෂ්ඨයේ

(10) අයඩින් ඌනතාවය නිසා ඇතිවන තත්වයක් නොවන්නේ,

(1) සම වියළි ස්වභාවයෙන් තිබීම.
(2) බුද්ධි වර්ධනයට බාධා ඇතිවීම.
(3) කායික මානසික උදාසීනත්වය.
(4) ප්‍රාග් පරිනත දරුවන් බිහිවීම.
(5) ඉක්මනින් වෙහෙසට පත්වීම.

(11) ජල අද්‍රව්‍ය තන්තු ලෙස හඳුන්වන්නේ,

(1) පෙක්ටින් හා ගම් වර්ග ය.
(2) සෙලියුලෝස් හා ලිග්නීන් ය.
(3) මියුසිලේජ් හා ලිග්නින් ය.
(4) ගම් වර්ග හා සෙලියුලෝස් ය.
(5) මියුසිලේජ් හා සෙලියුලෝස් ය.

(12) ඔමේගා - 3 මේද අම්ලය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) මෙහි ශාකමය ආහාර අඩංගු වේ.
(2) සිරුර තුළ නිපදවා ගත හැකි වේ.
(3) රුධිරයේ කොලෙස්ටරෝල් මට්ටම අඩු කරයි.
(4) ලිනොලෙයික් අම්ලය අඩංගු වේ.
(5) සංතෘප්ත මේද අම්ලයක් වේ.

(13) කාලීන මන්දපෝෂණයේ දී ඇතිවන කුරු බව ලංකාව තුළ දී දැකිය හැකි ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් ගත් කල එම ප්‍රමාණය,

(1) 50% කි. (2) 30% කි. (3) 60% කි.
(4) 40% කි. (5) 75% කි.

(14) A අස්ථි පහසුවෙන් බිඳී යයි.
B කකුල් බකල වේ.
C පිටකොන්දේ හා දණහිස්වල වේදනාව ඇතිවේ.
D පර්ශුවල කැල්සියම් තැම්පත් වේ.
E අස්ථි මොළොක් වේ.
මෙයින් "අස්ථි මාර්දවය" රෝගයේ රෝග ලක්ෂණයන් ලෙස හඳුනා ගත හැක්කේ,
(1) A, C, E වේ. (2) A, B, D වේ. (3) A, B, C වේ.
(4) C,D, E වේ. (5) A, C, D වේ.

(15) ආහාර පිසීම පිළිබඳ කරුණු කීපයක් පහතින් දැක්වේ. මින් නිරවද්‍ය කරුණ වන්නේ,
(1) ක්ෂුද්‍ර තරංග උඳුනක පිසින විට ආහාරයේ මැද සිට පිටතට පිසීම සිදුවේ.
(2) වැඩි ජල ප්‍රමාණයක් භාවිතයෙන් පිසින විට පිෂ්ඨය කැරමලීකරණය වේ.
(3) ස්ටු කිරීමේ දී තාප සංක්‍රාමණ ක්‍රමය විකරණය වේ.
(4) බේස්ට් කිරීම සඳහා එළවළු භාවිතා කරනු ලැබේ.
(5) අවම කාලයක් තුළ මේදයෙන් ආහාර පිසීම පෝච් කිරීම වේ.

(16) සුවඳ කාරකයක් හා තෙලිලෝද කාරකයක් පිළිවෙලින්,
(1) ලෙසිතීන් හා ඊතයිල් බියුටිරේට් ය.
(2) ලෙසිතීන් හා මොනොසෝඩියම් ග්ලුටමේට් ය.
(3) ඊතයිල් බියුටිරේට් හා ග්ලයිකෝල් ය.
(4) ග්ලයිකෝජන් හා ප්‍රොපිලීන් ය.
(5) ප්‍රොපිලීන් හා මොනොසෝඩියම් ය.

(17) ආහාර කුඩා කොටස්වලට බිඳහෙලීමෙන් පසු, ද්‍රව ආකාරයෙන් පවතින පෝෂක රුධිර ප්ලාස්මාවට එකතුවීම හැඳින්වෙන්නේ,
(1) ආහාර ජීර්ණයයි. (2) ආහාර අවශෝෂණයයි. (3) ආහාර පරිවෘතියයි.
(4) ආහාර ගමන් කිරීමයි. (5) ක්‍රමාකුංචනයයි.

(18) ආහාර ආකලන වන ඝනීකාරක සඳහා නිදසුනකි,
(1) සුදුළූණු හා ඉඟුරු (2) පෙක්ටින් හා ගොරක (3) සියඹලා හා ඒගාර්
(4) සියඹලා හා දෙහි (5) පෙක්ටින් හා ඒගාර්

(19) සුක්රෝස් තාපයට භාජනය කළ මුල් අවස්ථාවේ දී සිදුවන ක්‍රියාවලිය,
(1) කැරමලේන් ලෙස හැඳින්වේ.
(2) කැරමලීන් ලෙස හැඳින්වේ.
(3) කැරමලාන් ලෙස හැඳින්වේ.
(4) කැරමලෙන් හා කැරමලීන් ලෙස හැඳින්වේ.
(5) කැරමලාන් හා කැරමලෙන් ලෙස හැඳින්වේ.

(20) පලතුරු යුෂ කුඩු වශයෙන් සැකසීමේ දී භාවිතා වන උචිත වියළන ක්‍රමය වන්නේ,
(1) රික්තක වියළන ක්‍රමය වේ. (2) බෙර වියළන ක්‍රමය වේ. (3) උමං වියළන ක්‍රමය වේ.
(4) විසිර වියළන ක්‍රමය වේ. (5) කැබිනෙට්ටු වියළන ක්‍රමය වේ.

(21) ඇසුරුම් ද්‍රව්‍යයක් ලෙස පොලිඑතලීන් ටෙරෆ්තලේට් (PET) පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A තෙල්වලට තරමක් පාරගම්‍යවේ.
B සාපේක්ෂව මිල අඩුය.
C සිසිල් බීම බෝතල්, මෙගා බෝතල් මේ යටතට ගැනේ
D ශක්තිමත් බව අඩුය.
මින් නිවැරදි කරුණ වනුයේ,
(1) A, B, C (2) A පමණි. (3) A, C පමණි.
(4) C, D පමණි. (5) B හා D පමණි.

(22) මොනෝසෝඩියම් ග්ලූටමේට් (MSG)

(1) තෛලෝද්කාරකයකි. (2) ඝනීකාරකයකි. (3) රසකාරකයකි.
(4) රස ප්‍රවර්ධකයකි. (5) ප්‍රතිඔක්සිකාරකයකි.

(23) පිළිස්සීම මගින් කෙඳි හඳුනාගැනීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) ලෝම සහ සේද සෙමින් පිළිස්සී අළු අඟුරු මෙන් ඉතිරි වේ.
(2) කපු කෙඳි පිලිස්සූ පසු සුදු පැහැති අළු ඉතිරි වේ.
(3) නයිලෝන් කෙඳි පිළිස්සීමේ දී දැල්ලක් ඇතිව දැවේ.
(4) ඇස්බැස්ටෝස් කෙඳි ඉක්මනින් ගිනිගනී.
(5) සේද කෙඳි පිළිස්සීමේ දී කඩදාසි පිළිස්සෙන ගඳක් ඇති වේ.

(24) පහත රූප සටහනෙහි දැක්වෙන්නේ කෙන්දක දික්කඩ අන්වීක්ෂීය පෙනුමයි. මෙම කෙඳි වර්ග වනුවේ,

(1) කපු
(2) සේද
(3) ලිනන්
(4) විස්කෝස්
(5) පොලියෙස්ටර්

(25) A සහ B රූප සටහන් වලින් දැක්වෙන විටමන් ක්‍රම වනුයේ පිළිවෙලින්,



A



B

(1) දික් දාර හා ජටා වියමන
(2) හරස් දාර වියමන සහ චාම් වියමන
(3) සරල හිරි විටමන හා ජටා වියමන
(4) රළ හිරි වියමන හා චාම් වියමන
(5) දික්දාර හා හරස්දාර වියමන

(26) නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක සිදුකරන ක්‍රියාවලියේ පියවර ඇතුළත් වරණය වනුයේ,

(1) මෝස්තර නිර්මාණය, පිරිසැලසුම් නිර්මාණය, ඇසුරුම්කරණය
(2) පිරිසැලසුම් නිර්මාණය, කැඳහරණය, මළහරණය
(3) මෝස්තර නිර්මාණය, මාකර් සැකසීම, කැඳහරණය
(4) පිරිසැලසුම් නිර්මානය, රෙදිවල තත්ව පරීක්ෂාව, මළහරණය
(5) මෝස්තර නිර්මානය, කැඳහරණය, පිරි සැලසුම් නිර්මාණය

(27) රෙදි මසර කිරීම සඳහා භාවිතා කරන රසායනික ද්‍රව්‍යයක් වනුයේ,

(1) පර්මැංගනේට් (2) සෝඩියම් හයිඩ්‍රොක්ලෝරයිඩ් (3) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්
(4) සෝඩියම් බයිකාබනේට් (5) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ්

(28) ජලරෝධක නිමාව හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

(1) රෙද්දේ අවපැහැය ඉවත්කරයි.
(2) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් යොදාගනී.
(3) සවිවර බව ඇත.
(4) රෙදි ඇඳසිටීම පහසු ය.
(5) අද්‍රාව්‍ය ලෝහමය සංයෝග භාවිතා කරනු ලබයි.

(29) රෙදි මතුපිට අලංකාර කිරීමේ ක්‍රම අතරින් ප්‍රතිරෝධක මුද්‍රණ ක්‍රමයක් ලෙස හැඳින්වෙන්නේ,

(1) තිර රාමු මුද්‍රණය (2) රෝලර් මුද්‍රණය (3) ගැටපඩු ක්‍රමය
(4) ආරෝපණය කිරීම (5) අච්චු මුද්‍රණය

(30) සාය සතරෝම ගොඩ නැගීමේ දී පිටුපස ඉණ මිනුම ගණනය කරන නිවරදි ක්‍රමය වන්නේ,

(1) $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 4 + 0.25 cm

(2) $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 2 + 0.25 cm

(3) $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 3 + 0.25 cm

(4) $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 3 + 0.25 cm

(5) $\frac{\text{ඉණ මිනුම}}{4}$ + 4 + 1.25 cm

(31) ආචර ධර්ම හා සම්බන්ධ නිවැරදි කරුණු කීපයක් පහත දැක්වේ.

A ආයතනයක තොරතුරුවල රහස්‍ය භාවය ආරක්ෂා කළ යුතු ය.

B ආචාර ධර්ම සංස්කෘතිය ආගම හා සමාජ තත්ත්වය අනුව නොවෙනස්ව පවතී.

C සංවාද ගොඩනැගීමේ දී පොදු මාතෘකා තෝරාගැනීම වැදගත් ය.

D තලු නොමරා ආහාර ගැනීම.

මෙයින් සමාජ ආචාර ධර්ම වන්නේ,

(1) B හා C වේ. (2) A හා C වේ. (3) A හා D වේ.
(4) B හා D වේ. (5) C හා D වේ.

(32) ස්වභාවික ආකර්ෂණ සහ මානව නිර්මිත ආකර්ෂණය සඳහා උදාහරණ පිළිවෙලින්,

(1) උණවටුන වෙරළ තීරය හා මහනුවර දළදා පෙරහැර
(2) සිංහරාජ වනාන්තරය හා මහඔය, උණුදිය උල්පත්
(3) සිංහරාජ වනාන්තරය හා හුම්මානය
(4) මහනුවර දළදා පෙරහැර හා පින්නවල අලි අනාතාගාරය
(5) යාල අභයභූමිය හා මහඔය උණුදිය උල්පත්

(33) පුද්ගලයෙකුගේ පැවැත්ම තුළ ඇතිවන මානසික හා ශාරීරික ධනාත්මක වෙනස ඇති කිරීමට විවේකය, විනෝදය හා ලබන අද්දැකීම් හඳුන්වන්නේ,

(1) ආත්ම විශ්වාසය ලෙසය. (2) අධ්‍යාත්මික වර්ධනය ලෙසය. (3) ප්‍රතිමෝදනය ලෙසය.
(4) ප්‍රතිචාර ලෙසය. (5) ආත්ම අභිමානය ලෙසය.

(34) "සංකාසනය" යනුවෙන් අදහස් වන්නේ,

(1) පුද්ගල ආකර්ෂණය
(2) පුද්ගලයින්ගේ පෙනුම
(3) පුද්ගලයින්ගේ පෙනුම පුද්ගලයින් තම මතවාද ප්‍රකාශ කිරීම වේ.
(4) පුද්ගලයින් අතර මූලික සංවාද ගොඩනැගීම වේ.
(5) පුද්ගලයින්ගේ භාෂා දැනුම

(35) සලකා බලනු ලබන රටෙහි ආර්ථික බල ප්‍රදේශය තුළට අනේවාසිකව ආගන්තුකයින්ගේ සංචරණය හඳුන්වන්නේ,

(1) දේශීය සංචරණය ලෙසය.
(2) කලාපාන්තර සංචරණය ලෙසය.
(3) ජාතික සංචරණය ලෙසය.
(4) අභ්‍යන්තර යොමුගත සංචරණය ලෙසය.
(5) බාහිර යොමුගත සංචරණය ලෙසය.

(36) නිවසේ ජල සැපයුම හා පරිභෝජනය පිළිබඳව ඔබේ යෙහෙළියක් ලියා තිබූ පහත වැකි අතරින් නිවැරදි වනුයේ කුමක් ද?

(1) වැසි ජලය මෘදු බැවින් රෙදි සේදීමට යෝග්‍ය නොවන බව
(2) වැසි ජල ටැංකිය පොළොව මට්ටමට පහළින් පිහිටිය යුතුය.
(3) ප්‍රථම වැසි ජල කොටස වැසි ජල ටැංකියෙන් බැහැර නලය මගින් ඉවතට ගලායාමට සැලැස්වීම.
(4) නිවසේ ජල සැපයුම් පද්ධතියේ සේවා නලයෙන් ජලය සෘජුව නානකාමරයට සපයනු ලැබේ.
(5) සාමාන්‍ය මුළුතැන්ගේ බේසමට වඩා ජලය ගලායන වේගය රෙදි සෝදන යන්ත්‍රයට වැඩිය.

(37) පැරණි ගෘහ පරිපථවල සිගිති පරිපත බිඳින වෙනුවට භාවිතා වූ උපාංගය වන්නේ,

(1) විලායක (2) කෙවෙනිය (3) විබෙදුම් පෙට්ටිය
(4) අධිධාරා පරිපත බිඳිනය (5) වෙන්කරණය

(38) අසමාන විෂ්කම්භයෙන් යුත් නල දෙකක් සම්බන්ධ කිරීම සඳහා භාවිතා වන්නේ,

(1) වැලමිට නැම්ම (2) කෙවෙනිය (3) කරාම කෙවෙනිය
(4) ඌනන කෙවෙනිය (5) දොරටු කපාටය

(39) විසිත්ත කාමරයක ඇති 20 W විදුලි පහනක් දිනකට පැය 3 ක් දල්වා තිබේනම් මෙම බල්බය සඳහා සතියකට වැයවන විදුලි ඒකක ගණන කොපමණ ද?

(1) 0.2 kwh (2) 0.24kwh (3) 0.1kwh
(4) 0.42kwh (5) 420kwh

(40) විද්‍යුත් උපකරණයක් තත්පර එකකදී සිදුකරනු ලබන කාර්ය ප්‍රමාණය හඳුන්වන්නේ,

(1) ධාරාව ලෙසය. (2) ප්‍රතිරෝධය ලෙසය. (3) වෝල්ටීයතාවය ලෙසය.
(4) විදුලි ඒකකයක් ලෙසය. (5) විදුලි ජවය ලෙසය.

(41) හරිත පාරිභෝගිකයකු අනුගමනය කරන ක්‍රියා පිළිවෙත් සම්බන්ධව සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

(1) පරිසරයට අවම බලපෑම් ඇති නිෂ්පාදන මිලදී ගැනීම.
(2) සූන්‍යතා හා පුනර්ජනනීය ශක්ති සම්පත් භාවිතා කිරීම.
(3) මස්, මාළු වැනි ආහාර නිතර පරිභෝජනයට ගැනීම.
(4) එක් එක් කාලවල දී බහුල ආහාර පරිභෝජනය කිරීම.
(5) ශක්ති පරිභෝජනය අවම නිෂ්පාදන භාවිතයට ගැනීම.

(42) ඖෂධීය ශාක අතරින් විෂබීජ විනාශ කිරීමට භාවිතා වන ඖෂධ වන්නේ,

(1) පාවට්ටා, කෝමාරිකා (2) නීරමුල්ලිය, ගොටුකොළ (3) ගොටුකොළ, කොහොඹ
(4) තිප්පිලි, නීරමුල්ලිය (5) කොහොඹ, කහ

(43) ආහාර පිසීමේ දී පිටවන විමෝචක අඩු කිරීමට
A පියන වසා ආහාර පිසීම.
B ජලය අඩුවෙන් දමා ආහාර පිසීම.
C විශාල භාජනවල ආහාර නොපිසීම.
D මැටි වළංවල ආහාර පිසීම.
E දර උදුන් භාවිතය
මින් නිවැරදි කරුණු ඇතුළත් වරණය වනුයේ,
(1) A, B, C (2) B, C, D (3) E, C, D
(4) A, C, E (5) A, D, E

(44) හරිතාගාර ආවරණය වේගවත් කරන මිනිස් ක්‍රියා නොවන්නේ,
(1) පොසිල ඉන්ධන දහනය (2) දැව ඉන්ධන දහනය (3) වනාන්තර හරණය
(4) කසල ප්‍රතිචක්‍රීකරණය (5) කාර්මීකරණය

(45) නව යොවුන්විය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,
(1) ගෙසෙල්ට අනුව යොවුන්විය අවුරුදු 13 - 18 කාලය පෙන්වා දිය හැකිය.
(2) නව යොවුන්වියේ දී චිත්තවේග පරිණතිය ඉතා ප්‍රබලව පෙන්නුම් කරයි.
(3) ස්ව සංකල්පය ගොඩනැගීම මන්දගාමී බවක් පෙන්නුම් කරයි.
(4) ගතානුගතික චින්තනයෙන් මිදීමට උත්සහ කරයි.
(5) සංයුක්ත චින්තනයෙන් ව්‍යුක්ත චින්තනයට යොමුවීම.

(46) පූර්ව ප්‍රසව අවධිය තුළ දරුවාගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක කිපයකි,
A මවගේ චිත්තවේග
B මව ගන්නා ඖෂධ
C හිත මිතුරු සබඳතා
D මව ගන්නා ආහාර
E ආගමික ආයතන
මින් නිවැරදි කරුණු ඇතුළත් වරණය වනුයේ,
(1) A, B, C (2) A, B, D (3) C, D, E
(4) A, B, E (5) A, C, D

(47) මානසික පීඩනය පෙන්නුම් කරන දරුවකුගේ චිත්තවේගී ලක්ෂණයක් වනුයේ,
(1) කෑම අරුචිය (2) හිසරදය (3) වැරදිකාර හැඟීම
(4) වික්ෂිප්ත බව (5) මතකය නොමැති බව

(48) සමබර පෞරුෂයක් පවත්වා ගැනීම සඳහා පුද්ගලයකු තුළ පවතින ජීව විද්‍යාත්මක සාධක වනුයේ,
(1) පෙනුම, වර්ණය, හැඩය (2) මවගේ පෝෂණය (3) ඇසුරුකරන්නන්
(4) වෙනත් අධ්‍යාත්මික සාධක (5) සමවයස් ඇසුර

(49) ව්‍යවසායකයකුගේ ලක්ෂණයක් නොවන්නේ,
(1) අලුත් දෙයක් කිරීම.
(2) දිගුකාලීන සිහින තිබීම.
(3) අවධානම්වලට මුහුණ දෙයි.
(4) අනුකරණය කරන්නෙකු නොවීම.
(5) පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගනියි.

(50) ව්‍යාපාරයක් ඇරඹීමේ දී හා අලවි උපක්‍රම සෙවීමේ දී සැළකිය යුතු කරුණු වන්නේ,
(1) වෙළඳපළ විශ්ලේෂණය
(2) ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන පිළිබඳ විශ්ලේෂණය
(3) අලෙවිකරණ සැලැස්ම විශ්ලේෂණය
(4) නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ විශ්ලේෂණය
(5) වෙළඳපල තරගකාරීත්වය විශ්ලේෂණය

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

28 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

විභාග අංකය: ....

ගෘහ ආර්ථික විද්‍යාව - II

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය වි. 10

සැලකිය යුතුයි :-
- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 06 කට පිළිතුරු සපයන්න.

1) (i) ගොඩනැගිලි හා අවට පරිසර නිර්මාණයේ දී යොදාගන්නා "තිරසර බව" යන්න හඳුන්වන්න.
(ii) විටමින් B_2 අඩංගු ආහාර වර්ග 4 ලියන්න.
(iii) පුද්ගලයකු ස්ථුලතාවයෙන් පෙළෙන බව නිර්ණය කළ හැකි සාධක මොනවා ද?
(iv) පිසීමේ දී පිෂ්ඨය හා ප්‍රෝටීන් අඩංගු ආහාරවල සිදුවන විපර්යාස 1 බැගින් ලියන්න.
(v) ඇඟලුම් කර්මාන්තයේ දී "මාකර් සටහන් තැබීම" යන්න පැහැදිලි කරන්න.
(vi) රෙදිපිළි සහ නිමි ඇඳුම්වල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමට යොදාගනු ලබන කැඳහරණය කළ හැකි ක්‍රම 2 ලියන්න.
(vii) සන්නිවේදන මාධ්‍යයක් වන දුරකතනය භාවිතයේ දී නොකළ යුතු කරුණු 2 ලියන්න.
(viii) ආහාර රස ප්‍රවර්ධක සඳහා උදාහරණ 2 ලියන්න.
(ix) පහත ඖෂධවල ප්‍රයෝජන 1 බැගින් ලියන්න.
1. තිප්පිලි
2. පාවට්ටා
3. ඉරිවෙරිය
4. කෝමාරිකා
(x) පුද්ගලයකුගේ "සමබර පෞරුෂය" යන්නෙන් කුමක් අදහස් වේද? (ලකුණු 2 x 10 = 20)

i) අතීත මිනිසා තම ජීවන පරිසරය, ප්‍රශස්ත කර ගැනීමේ දී අභ්‍යන්තර අවකාශය සකස් කරගත් ආකාරය නිදසුන් මගින් කෙටියෙන් පහදන්න. (ලකුණු 03)

i) නිර්මාණකරණයේ දී යොදාගන්නා "සංකල්පීය එළඹුම" යන්න හඳුන්වා එහි සාධක නම් කරන්න. (ලකුණු 03)

i) A බත් පිසින උඳුනෙහි (Rice Cooker) ක්‍රියාකාරීත්වය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
B පහත සඳහන් උපාංගවලින් කෙරෙන කාර්යයන් පහදන්න.
1. ශේෂධාරා පරිපථ බිඳිනය
2. විලායකය (ලකුණු 1 බැගින් ලකුණු 02 යි මුළු ලකුණු 04)

නිවසේ උත්පාදනය වන අප ජල මූලාශ්‍ර 3 ක් නම් කර ඒවා බැහැර කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 16 යි.)

කාබෝහයිඩ්‍රේට ජීර්ණය සඳහා උපකාරීවන එන්සයිම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

මලබද්ධයෙන් පෙළෙන පුද්ගලයකුට ලබාදිය යුතු පෝෂණමය උපදෙස් තුනක් සඳහන් කරන්න. (ලකුණු 04)

කැල්සියම් මහා ඛනිජයකි, වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04)

මුල් ළමාවියේ දරුවකුට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයට රැගෙනයාම සඳහා සුදුසු දිවා බොජුන්පතක් සැලසුම් කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 16 යි.)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(04) (i) නවීකෘත පාලිත පරිසරය තත්ත්ව යටතේ ආහාර පරිරක්ෂණය පැහැදිලි කර ඒ සඳහා උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 03)

(ii) දුම් ගැසීම මගින් මස්, මාළු, වැනි ආහාර පරිරක්ෂණය කිරීමේ වාසි හා අවාසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ව්‍යාපාරිකයෙකු පලතුරු ආශ්‍රැති විජලනයට ලක්කිරීම ගැලීම සටහනකින් දක්වන්න. (ලකුණු 04)

(iv) ඔබ සුළු පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබුවේ නම් එයට "කයිසෙන් සංකල්පය" යොදාගැනීමෙන් ඵලදායිතාව වැඩිකිරීමේ දී අවධානය යොමුකළ යුතු කරුණු දක්වන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 16 යි.)

(05) (i) රටේ ආර්ථිකය සංවර්ධනය හා විදේශ විනිමය ගලාඑන සම්පතක් ලෙස ශ්‍රී ලංකාවේ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය වැදගත් තැනක් ගැනීමට හේතු කවරේ ද? (ලකුණු 04)

(ii) නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක සිදුකරන ක්‍රියාවලියක පියවර ලෙස "පිරිසැලසුම්" නිර්මාණය වැදගත් අවස්ථාවකි. එසේ පිරිසැලසුමක් යන්න නිර්වචනය කරන්න.
පිරිසැලසුමකට ඇතුළත් විය යුතු ලක්ෂණ 3 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) විශේෂ අවස්ථාවල දී භාවිතය සඳහා ගන්නා ඇඳුම්වලට යොදන නිමාවන් 4 ක් නම් කරන්න. (ලකුණු 04)

(iv) ඔබ 12 වසරේදී මසන ලද මේස රෙද්දට අලංකරණයට සුදුසු මුද්‍රණ ක්‍රම 4 ක් නම් කරන්න.
ඔබ නම් කරන ලද එක් මුද්‍රණ ක්‍රමයක් යොදා මේස රෙද්ද අලංකරණය කරන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16 යි.)

(06) (i) හරිතාගාර වායු අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග 3 ක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) සම්පත් අවභාවිතය යන්න හඳුන්වා, ඒ නිසා ඇතිවිය හැකි අනිසි විපාක 02 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) සංචාරක නියෝජිත ආයතනවල කාර්යභාරය විමසන්න. (ලකුණු 04)

(iv) (අ) ගමන් කරන ප්‍රමාණය අනුව සංචරණය වර්ගකර දක්වන්න. (ලකුණු 02)

(ආ) එම සංචරණවල ඇති වෙනස්කම් පහදන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 16 යි.)

(07) (i) "ගෝර්ඩන් ඔල්පොට්" නම් මනෝවිද්‍යාඥයා "පෞරුෂය" නිර්වචනය කර ඇති ආකාරය ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) යොවුන්වියේ දී මානසික ඒකාග්‍රතාව ඇති කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් පැහැදිලි කරන්න. (නම්කිරීමට ල. 02 යි. පැහැදිලි කිරීමට ල. 02 යි.) (මුළු ලකුණු 04)

(iii) සමහර යොවුන් දරුවන් තුළ ඇතිවන මානසික පීඩනය කායිකව ද පෙන්නුම් කරයි. උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iv) නව යොවුන්වියේ සදාචාර සංවර්ධනය සිදුවන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(මුළු ලකුණු 16 යි.)

(08) පහත දැක්වෙන මාතෘකා අතුරින් 04 ක් පිළිබඳ කෙටිසටහන් ලියන්න. (ලකුණු 04)

(i) සාය පතරමහි ඉදිරිපස ඉණ ආරය සකස් කිරීම

(ii) ආහාර ඇසුරුම් කිරීම සඳහා වීදුරු භාවිතය

(iii) ගෘහ අභ්‍යන්තර අලංකරණයේ දී [illegible] භාවිතයෙහි [illegible]

(iv) බාහිර අවකාශ නිර්මාණයේ [illegible]

(v) ක්‍රියාකාරී ආහාර

(9) WWW.PastPapers.WiKi (9)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO

LOL.lk
BookStore

විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න

කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION pesuru Prakashana Private Ltd. Akura Pilot සමනල දැනුම සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න